සියළුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2
Model Paper - 2

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - (80) 1 - පත්‍රය
Information and Communication Technology - (80) Paper - 1

කාලය පැය එකයි. **One Hour.**

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ❖ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා, ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ ඊට අදාල අංකය මත කතිරයක් (x) යොදන්න.
- ❖ 1 පත්‍රය සඳහා පැය එකක් (01) ද, 11 පත්‍රය සඳහා කාලය පැය දෙකක් (02) ද, වශයෙන් සම්පූර්ණ කාලය පැය තුන (03) කි.
- ❖ 1 සහ 11 පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වනසේ අමුණා භාර දෙන්න.

---

1. ඉගෙනීමට ඉතා දක්ෂ දරුවෙක් වන හිරුණිකා පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ද ත්‍යාග රාශියකට හිමිකම් ලබන්නීය. 10 වන ශ්‍රේණියේ අවසාන වාර පරීක්ෂණ ලකුණු වාර්තා පිළියෙල කර අවසාන වූ ගුරු මහත්මිය, පන්තියේ පළමුවෙනියා හිරුණිකා බව සියළුම සිසුන් කැඳවා ප්‍රකාශ කළාය. එය ඇසූ ඇගේ මිතුරියන් එම මොහොතේම ඇයට සුභ පැතුවාය. මෙම තොරතුරෙහි උපරිම වටිනාකම හිරුණිකාට ලැබුණේ කවර මොහොතේදී ද?

   (1) පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී හිරුණිකා ගේ නම ප්‍රකාශ වූ අවස්ථාවේදීය.
   (2) පන්තියේ පළමුවෙනියා හිරුණිකා බව ගුරු මහත්මිය සිසුනට මුලින් ම පැවසූ මොහොතේදීය.
   (3) පන්තියේ පළමුවෙනියා හිරුණිකා බව දෙමව්පියන් දැනගත් මොහොතේදීය.
   (4) මිතුරියන් හිරුණිකාට සුභ පැතූ මොහොතේදීය.

2. පහත දී ඇති පරිගණක උපාංග -(Divices) සලකන්න.

   A- යතුරු පුවරුව (Key board) B- මුද්‍රකය (Printer) C- ස්පර්ශ තිරය (Touch screen)
   D- ඩිජිටල් කැමරාව (Digital camera) E- ස්පර්ශ තලය (Touch pad).

   මේවා අතරින් ආදාන/ප්‍රතිදාන උපාංග-(Input/Output devices) ලෙස සැලකිය හැක්කේ මොනවාද?
   (1) A හා B ය. (2). C හා D ය._ (3) A හා E ය. (4) C,D හා E ය.

3. රික්ත නල - (Vacuum tubes) තාක්ෂණයෙන් ආරම්භව පසුව ට්‍රාන්සිස්ටර්- (Transistor), අනුකලිත පරිපථ (Integrated circuit) සහ ක්ෂුද්‍ර සකසන-(Micro processors) තාක්ෂණය මගින් ප්‍රතිස්ථාපනය-(Replace) කිරීමෙන් පරිගණක වල දක්නට ලැබුණ විශේෂත්වය සඳහන් වන්නේ කුමන පිළිතුරෙහිද ?

   (1) ප්‍රමාණය (size) කුඩා වීම, කාර්යක්ෂමතාව (efficiency) ඉහල යාම, සහ ධාරිතාව (capacity) වැඩි වීම.
   (2) ප්‍රමාණය විශාල වීම, විශ්වශ්‍යතාවය (reliability) වැඩි වීම සහ හැකියාව (capability) වැඩි වීම.
   (3) ප්‍රමාණය විශාල වීම, ධාරිතාව වැඩි වීම සහ ස්වයංක්‍රීය බව (automate).
   (4) කාර්යක්ෂමතාව ඉහල යාම, සහ ධාරිතාව අඩු වීම සහ ප්‍රමාණය විශාල වීම.

4. A- සංගත තැටියකට (compact disk-CD) වඩා සුනම්‍ය (floppy disk)තැටියක් දත්ත ගබඩා කරයි.
   B- සසම්භාවී ප්‍රවේශ මතකය (Random access memory) ඉක්මනින් මැකී යන (volatile) මතකයකි.
   C- දෘඩ තැටිය (hard disk), සහායක ගබඩාකරණ (auxiliary storage) උපාංගයකි.
   ඉහත පුකාශ අතරින් සත්‍ය ප්‍රකාශ වන්නේ මොනවාද ?

   (1) A හා B ය. (2). A හා C ය. (3) B හා C ය. (4) B පමණි.

5. 0.04736250 සංඛ්‍යාවේ වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය (MSD) සහ අඩුම වෙසෙසි සංඛ්‍යාංකය (LSD) පිළිවෙළින් දක්වා ඇත්තේ කුමන පිළිතුරේද ?

(1) 0 හා 0 ය. (2). 4 හා 5 ය. (3) 0 හා 5 ය. (4) 4 හා 0 ය.

6. AC_{16} ලෙස දක්වා ඇති ෂඩ් දශම සංඛ්‍යාවට තුල්‍ය වන සංඛ්‍යාව දී ඇත්තේ කුමන පිළිතුරේද ?

(1) $1010\ 1100_2$. (2) 255_8. (3) 173_{10}. (4) 254_4.

7. $P = 1011_2$, $Q = 7_8$, නම් P - Q = …………වේ.

(1) 10010_2. (2) 4_{16}. (3) 10_{10}. (4) 1000_2.

8. දත්ත සන්නිවේදනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A. පූර්ණ ද්විපථ (Full duplex) සන්නිවේදනය සෑම මොහොතකම දිශා දෙකටම සිදුවේ.
B. පොදු මංමාරු දුරකථන ජාල (PSTN -Public Switched Telephone Networks), අර්ධ ද්විපථ සන්නිවේදන ක්‍රමය භාවිත කරයි.
C. රූපවාහිනී සන්නිවේදනය, ඒකපථ - (Symplex) සන්නිවේදන ක්‍රමය භාවිත කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි.

9. සීමිත ඕවර 20-20 ක්‍රිකට් තරගයක දී පළමුව පන්දුවට පහරදුන් A කණ්ඩායම ඕවර 20 අවසානයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව 128 කි. ඊට පිළිතුරු වශයෙන් දෙවනුව පහර දුන් B කණ්ඩායම ඕවර 18 පන්දු කදී, තරගය ලකුණු 45 කින් ජයග්‍රහණය කළාය. B කණ්ඩායම ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණද?

(1) 101101_2. (2) 255_8. (3) 213_{16}. (4) 113_8.

10. 0110010 මගින් ASCII හි 2 නිරූපණය කරනු ලබයි නම්, 0111001 මගින් නිරූපණය වන්නේ පහත කවරක්ද ?

(1) 9. (2) F. (3) C. (4) 19.

11. දී ඇති තාර්කික පරිපථයේ අවසාන ප්‍රතිදානය F හි, අගය 1 වීම සඳහා A, B, සහ C යන ආදානයන් තුල තිබිය යුතු අගයන් පිළිබඳ නිවැරදි අදහස දැක්වෙන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශයෙන්ද?



(1) A සහ B ආදාන වල අගය පමණක් 1 වීම ප්‍රමාණවත්ය.
(2) A සහ C ආදාන වල අගය පමණක් 1 වීම ප්‍රමාණවත්ය.
(3) A = 1, B = 0, සහ C = 1 විය යුතුය.
(4) A = 0, B = 1, සහ C = 0 විය යුතුය.

12. එක්තරා විභාගයක් සඳහා ඉදිරිපත් වන සිසුන් A හා B යන විෂයයන් දෙකටම පෙනී සිටීම අනිවාර්ය වන අතර C හා D යන විෂයයන් දෙකෙන් එකකට පෙනී සිටිම ප්‍රමාණවත්ය. මෙම සංසිද්ධිය නිරූපණය කිරීම සඳහා යොදා ගත හැකි බූලියානු ප්‍රකාශනය පහත සඳහන් ඒවායින් කුමක්ද?

(1) A AND B OR C OR D ය. (2). A AND B OR (C AND D) ය.
(3) A AND B AND (C OR D) ය. (4) A AND B AND (C XOR D) ය යුතුය.

13. පහත දී ඇති තාර්කික ද්වාර පරිපථ අතරින් NOT තර්කනය පෙන්නුම් කරන්නේ කුමන පරිපථයෙහිද? /පරිපථවලද?



A B C D

(1) A පමණි. (2) A සහ C පමණි. (3) A, B සහ D පමණි. (4) A,B,C,D සියල්ලම.

14. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

a මධ්‍ය සැකසුම් ඒකකෙය් (CPU) අඩංගු උපාංග වන්නේ රෙජිස්තර මතකය (registers), සසම්භාවී ප්‍රවේශ මතකය (random access memory), අංක ගණිතමය හා තාර්කික ඒකකය (Arithmetic and logic unit - ALU) සහ පාලන ඒකකය (Control Unit-CU)

b උපෙදස් ක්‍රියාත්මක වන තුරු තාවකාලිකව දත්ත රඳවා තබා ගනු ලබන්නේ පාලන ඒකකය (Control Unit(CU)) තුලය

c ගණිතමය හා තාර්කික ඒකකය (Arithmetic and logic unit-ALU) සියලු ගණිතමය ගණනය කිරීම් සිදුකරනු ලබයි.

මේ ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ තෝරන්න.

(1) a පමණි. (2) a සහ b පමණි. (3) c පමණි. (4) b සහ c පමණි.

15. PROM (Programmable read only memory) සහ EPROM (Erasable programmable read only memory) අතර වෙනස දැක්වෙන්නේ කුමකින්ද ?

(1) PROM එකට වඩා EPROM හි විශාලත්වය වැඩිය
(2) PROM මෙන් නොව, EPROM හි ඇති දේ ඉලෙක්ට්‍රොනිකව මැකිය හැක
(3) PROM මෙන් EPROM හි ඇති දේ පාරජම්බුල ආලෝකයෙන් මැකිය හැක
(4) PROM මෙන් නොව EPROM ඇති දේ පාරජම්බුල ආලෝකයෙන් මැකිය හැකි අතර කිහිප විටක් නැවත ලිවිය හැක.

16. A සහ B නම් සසම්භාවී ප්‍රවේශ මතක-(RAM) දෙකක ධාරිතා පිලිවෙලින් 2. GB සහ 2^{11}. MB වේ. ඒවායේ මතක ධාරිතාව පිළිබඳව පහත දී ඇති කුමන ප්‍රකාශය නිවැරදි වේද?

(1) B හි මතක ධාරිතාවය A හි මතක ධාරිතාවයට වඩා වැඩිය.
(2) A හි මතක ධාරිතාවය B හි මතක ධාරිතාවයට වඩා වැඩිය.
(3) A හි මතක ධාරිතාවය B හි මතක ධාරිතාවයට සමානය.
(4) මතක ධාරිතාවන් වෙනස් මිනුම් ඒකක වලින් දක්වා ඇති නිසා A හා B සැසඳීම කල නොහැකිය.

17. පහත ප්‍රකාශ අතරින් මෙහෙයුම් පද්ධති සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශ මොනවාද ?

A - දෘඪාංග පාලනය හා මෘදුකාංග කළමනාකරණය සඳහා මෙහෙයුම් පද්ධතියක් අත්‍යවශ්‍ය වේ.
B - ෆෙඩෝරා (Fedora) යනු හිමිකම් ආශ්‍රිත (Copyright) මෙහෙයුම් පද්ධතියකි.
C - මෙහෙයුම් පද්ධති, යෙදුම් මෘදුකාංග (Application software) වර්ගයට අයත් වේ.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි.

18. ශිෂ්‍යයින් හත් දෙනෙක් ගණිත පරීක්ෂණයකදී ලබාගත් ලකුණු ප්‍රතිශත දැක්වෙන ඉලෙක්ට්‍රොනික වැඩපතක කොටසක් රූපයේ දැක්වේ. ඔවුන් අතරින් අඩුම වශයෙන් ලකුණු 40 ක් ලබාගෙන ඇති සිසුන් “PASS” ලෙසත් ඊට අඩු ලකුණු ලබා ඇති සිසුන් “FAIL” ලෙසත් ඇගයීමට ලක් කෙරේ. C තීරයේ පහලට පිටපත් කල විට “PASS” හෝ “FAIL” යන ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා C7 කෙටුවේ (Cell) ලිවිය යුතු සූත්‍රය පෙන්වා ඇත්තේ කිනම් පිලිතුරේද ?

(1) =IF(B2<40, “PASS”,”FAIL”)
(2) =IF(B2>=40, ” PASS”, “ FAIL”)
(3) =IF(B7<40, “FAIL” , “PASS”)
(4) =IF(B7<=40, “FAIL” ,”PASS”)

	A	B	C	D
1	Name	Maths Marks	Status	
2	Amal	78		
3	Anil	62		
4	Aruna	24		
5	Amara	40		
6	Ashen	92		
7	Amali	56		
8	Amila	84		

19. ඉලෙක්ට්‍රොනික වැඩ පතක (Work Sheet) කෝෂයක් (Cell) තුල <u>අසත්‍යයි - (False)</u> යන්න ප්‍රත්‍යාගමනය (return) කරනු ලබන්නේ පහත සඳහන් කවර ප්‍රකාශනය මගින්ද ?

(1) = (1 >= 1) මගිනි.
(2) = 6 < > (0 + 1 + 2+3-4) මගිනි.
(3) = Not(1 + 2 + 3 = 6) මගිනි.
(4) =And(1 + 1 =2,1 - 1 = 0) මගිනි.

20. වදන් සැකසුම් මෘදුකාංගයක ඇති මෙහි දැක්වෙන අයිකනයෙන් නිරූපන වන අදහයස කුමක්ද ?



(1) ඡේදයක් වමට එකෙල්ල (Left Align) කිරීම
(2) ඡේදයක් දකුණට එකෙල්ල (Right Align) කිරීම
(3) ඡේදයක අනුච්ඡේදන මට්ටම වැඩි කිරීම (Increase Indent)
(4) ඡේදයක අනුච්ඡේදන මට්ටම අඩු කිරීම (Decrease Indent)

21. පහත සඳහන් කරුණු අතරින් සංවෘත පද්ධතියක - (Closed system) පවතින මූලික ලක්ෂණ මොනවාද?

A. කිසියම් සීමිත බල ප්‍රදේශයක් තුල හුදකලාව පැවතිම.
B. විවිධ පද්ධතින් හා සබැඳිව තොරතුරු ලබා ගැනීම.
C. බාහිර විචල්‍යය සමග සබඳතා නොපැවැත්වීම.
D. අපාරගම්‍ය වීම.
E. ආදාන -(Input) පරිසරයෙන් ලබා ගැනීම සිදුකල ද, ප්‍රතිදාන -(Output) පරිසරයට ලබා නොදීම.

(1) A, සහ B පමණි. (2) A, C සහ D පමණි. (3) B, D සහ Eපමණි. (4) C, D සහ Eපමණි.

22. ♦ එකම ආකෘතියෙන් යුතු සහතික පත්‍රයක පිටපත් විශාල ප්‍රමාණයක් මුද්‍රණය කිරීමට සිදුව ඇත.
♦ එසේම සෑම සහතික පත්‍රයකම, සහතිකපත් අංකය, නම, පාසල, තරඟ කාණ්ඩය, ස්ථානය, වැනි එකිනෙකට වෙනස් දත්ත අන්තර්ගත කළ යුතුව ඇත.

මෙම කාර්ය පහසු කර ගැනීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගයක, ප්‍රයෝජනයට ගත හැකි විශේෂ පහසුකම හඳුන්වනනේ කෙසේද ?

(1) Mailings ලෙසය.
(2) Auto Print ලෙසය.
(3) Mail Merge ලෙසය.
(4) Auto Correct ලෙසය.

23. A - Worms B - Spyware C - Viruses D - Trojans

පරිගණකයයේ ස්ථාපනය වෙමින් පරිගණකයේ තොරතුරු පිටතට ලබා දීම සඳහා කටයුතු කරන, හා අන්තර් ජාල සම්බන්ධතා වලදී පරිගණකයේ රහස්‍ය තොරතුරු වෙනත් පරිගණක වෙත සම්ප්‍රේෂණය කරන වැඩ සටහන් ඉහත A, B, C සහ D අතරින් මොනවාද ?

(1) A සහ B පමණි.
(2) B පමණි.
(3) A,B සහ C පමණි.
(4) A, B, C සහ D යන සියල්ලම.

24. තොරතුරු පද්ධතියක් (Information System) සම්බන්ධයෙන් **<u>නිවැරදි</u>** ප්‍රකාශය/ප්‍රකාශ කුමක්ද?

A. නිපුණතා පද්ධති (Expert System) වලදී මිනිස් ඥානය මෙන් පරිගණකයේ ඇති කෘත්‍රිම බුද්ධියද භාවිතයට ගනී.
B. පරිගණක පාදක තොරතුරු පද්ධතියක් (Computer Base Information System) සකස් කිරීමේ මුල්ම පියවර පද්ධතිය විශ්ලේෂණයයි.
C. අභ්‍යන්තර හා බාහාර මූලාශ්‍ර වලින් ලබා ගන්නා දත්ත තීරණ ගැනීම සඳහා උචිත තොරතුරු බවට පත්කිරීම තොරතුරු පද්ධතියකින් සිදුවේ.
D. ඉහල මට්ටමේ කළමණාකාරිත්වය මගින් ගනු ලබන තීරණ වලට අනුග්‍රහය දැක්වීම සඳහා ගණුදෙනු සැකසුම් පද්ධතිය (Transaction Processing System) බෙහෙවින් උපකාර වේ.

(1) A, පමණි. (2) A, සහ C පමණි. (3) B සහ D පමණි. (4) C සහ Dපමණි.

25. පද්ධතියක් ලෙස ජංගම දුරකථනයක ක්‍රියාකාරිත්වය සැලකීමේ දී, එහි කාර්ය බද්ධ අවශ්‍යතාවක් දක්වා ඇත්තේ කිනම් පිළිතුරෙහිද ?

(1) ජංගම දුරකථනය මිල දී ගැනීමට ගෙවන ලද මුදල.
(2) ජංගම දුරකථනයෙහි තිරයේ ප්‍රමාණය.
(3) ජංගම දුරකථනයෙහි විද්‍යුත් කෝෂයේ ක්‍රියාකාරිත්වය පවත්නා කාලය.
(4) ජංගම දුරකථනයෙන් ඇමතුමක් ලබා ගැනීම.

26. මෙහි දී ඇති දී ඇති ගැලීම් සටහනට අදාල පහත දැක්වෙන කවර ප්‍රකාශයන් සත්‍ය ද?



(1) පරිශීලකයා ඍණ ලකුණක් ඇතුළත් කළ විට ක්‍රියාවලිය නවතියි.
(2) ලකුණ 75 ඇතුළත් කළ විට ‘ඔබ ඉතා දක්ෂයි’ යන පණිවුඩය ලැබෙයි.
(3) ලකුණු 30 ඇතුළත් කළ විට ‘ඉගෙනීමට තව උනන්දු වන්න’ යන පණිවුඩය ලැබෙයි.
(4) ලකුණ 50 ඇතුළත් කළ විට ‘ඉගෙනීමට තව උනන්දු වන්න’යන පණිවුඩය ලැබෙයි.

27. විවෘත හා නිදහස් මෘදුකාංග (Free and Open Source Software) භාවිතය පිළිබඳ වර්තමාන සමාජයේ වැඩි පෙළඹවීමක් හා නැඹුරුතාවයක් ඇතිවෙමින් තිබේ. එමගින් සමාජයට හා රටකට අත් වන වාසි දක්වා ඇති පිළිතුර තෝරන්න.

a. වියදමකින් තොරව මෘදුකාංග භාවිතා කිරීමේ හැකියාව.
b. එම මෘදුකාංග වැඩි දියුණු කර අපට ගැලපෙන ආකාරයට භාවිතා කිරීමේ හැකියාව
c. මෘදුකාංග සඳහා පිට රටට ඇදී යන විනිමය ඉතිරි කර ගත හැකිවීම.
d. එම මෘදුකාංග ඉලක්ක කර ගත් වෛරස් ප්‍රමාණය වැඩිවීම.

(1). a හා b පමණි. (2). a හා c පමණි.
(3). a, b හා c පමණි. (4) ඉහත සියල්ලම.

28. පහත දී ඇති ගැලීම් සටහන උපයෝගී කර ගනිමින් එහි A ලෙස දක්වා ඇති ප්‍රතිදානයේ අගය ලියන්න.



(1). 10 වේ. (2). 11 වේ. (3). 9 වේ. (4). 12 වේ.

29. පහත දක්වා ඇති ව්‍යාජ කේතයෙහි ප්‍රතිදානය කුමක්ද?

```
X= 100 ,  i = 0
Repeat
        i  = i  +  1
        X = X + i
Until ( i  > 2)
Print  X
```

(1). 101 වේ. (2). 100 වේ.
(3). 106 වේ. (4). 105 වේ.

30. 216.27.61.37 යන IP ලිපිනය, පරිගණකය හඳුනා ගන්නා ආකාරය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක්ද ?

(1) 11011000. 00011011. 00111101. 00100101
(2) 00111101. 00011001. 10110011. 10011010
(3) 10001100. 01001001. 10010010. 10000011
(4) 11110001. 01001001. 10010010. 11010011

31. වෙබ් ලිපිනයක් (Web Address), IP ලිපිනයක් බවට පරිවර්තනය කර, IP ලිපිනය භාවිතයෙන් වෙබ් සේවා අනුග්‍රාහකයන් වෙත යොමු කරනු ලබන සේවා අනුග්‍රාහකය කුමක් ද?

(1) වෙබ් සේවාඅනුග්‍රාහකය (Web server).
(2) වසම් නාම සේවාඅනුග්‍රාහකය (DNS Server).
(3) ගොනු සේවාඅනුග්‍රාහකය (File server)
(4) ගොනු හුවමාරු නියමාවලි සේවාඅනුග්‍රාහකය(FTP server).

32. පහත දැක්වෙන e-mail ලිපින සලකන්න.

A- abc.exampl.com B- abc.xyz@example.com
C- abc.@example.com D- abc@example.com

ඉහත නිවැරදි e-mail ලිපින මොනවාද ?

(1). A හා E පමණි. (2). B,C හා D පමණි. (3). B හා D පමණි. (4). D පමණි.

33 කරනු ලබන උපදේශ කේතය/උසුලනය (Tag) එක පෙන්නුම් කරන්නේ කෙසේද ?

(1). <link = “URL”> </link> ලෙසය. (2). <link> “URL” ලෙසය.
(3). <a href = “URL”> ලෙසය. (4). <Weblink> = “URL” </Web> ලෙසය.

34.

```
<table border="1">
<tr>
  <th>Name</th>
  <th>Home phone</th>
  <th>Mobile phone</th>
</tr>
<tr>
  <td>Bill Gates</td>
  <td>0940177 854</td>
  <td>0777887744</td>
</tr>
</table>
```

ඉහත HTML කේත ඛණ්ඩයට අදාල නිවැරදි ප්‍රතිදානය වෙබ් අතරික්සුවක් මගින් පෙන්නුම් කරන්නේ පහත දැක්වෙන කුමන පිළිතුරෙහිද ?

Name	**Mobile phone**	**Home phone**
Bill Gates	0777887744	0940177 854

(1)

Name	Bill Gates
Mobile phone	0777887744
Home phone	0940177 854

(2)

Name	**Home phone**	**Mobile phone**
Bill Gates	0940177 854	0777887744

(3)

Name	Bill Gates
Home phone	0940177 854
Mobile phone	0777887744

(4)

35. HTML ලේඛනයක, පහත දී ඇති කේත ඛණ්ඩයට (Code segment) අනුව ලැබෙන නිවැරදි ප්‍රතිදානය තෝරන්න.

```
<html>
<body>
<ol type="1">
        <li>Yala</li>
        <ol type="i">
                <li>lion</li>
                <li>tiger</li>
        </ol>
        <li>Kumana</li>
        <ol>
                <li>parrot</li>
                <li>peacok</li>
        </ol>
</ol>
<body>
<html
```

(1)

1. Yala
   - Lion
   - Tiger
2. Kumana
   - Parrot
   - Crow

(2)

1.Yala
   i. Lion
   ii.Tiger
2. Kumana
   i. Parrot
   ii. Crow

(3)

1.0 Yala
   1.1 Lion
   1.2 Tiger
2.0 Kumana
   2.1 Parrot
   2.2 Crow

(4)

- Yala
  - o Lion
  - o Tiger
- Kumana
  - o Parrot
  - o Crow

36. පරිගණක වෛරස් (virus) සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කුමක්ද ?

(1) තමා වැනිම වූ තවත් වෛරස් නිපදවීම හෙවත් ප්‍රතිවලිත (Replicate) වීමට හැකිවීම
(2) සියළුම පරිගණක වෛරස් මිනිසා විසින් නිර්මාණය කරන ලද ඒවාය
(3) පරිගණක භාවිතා කරන්නන්ට රෝග ආසාදනය වීම ඉක්මන් වේ.
(4) වෙනත් ගොනු සමග සම්බන්ධවී ඒවායේ කාර්යයන් අවුල් කරයි.

37. සංඛ්‍යාංක තාක්ෂණය යෙදූ හැඳුනුම්පතක් (Digital Identity card) ලබා දීම, මගින් රජයට ලැබිය හැකි වාසියක් නොවන්නේ කුමක්ද?

(1) තොරතුරු විමසීම සඳහා තාක්ෂණික දැනුම අවශ්‍ය වීම.
(2) වැඩි තොරතුරු ප්‍රමාණයක් හැඳුනුම්පතට ඇතුළු කළහැකි වීම.
(3) අනාවරකයක් භාවිතයෙන් ඉක්මණින් පුද්ගලයා පිළිබඳ තොරතුරු ලබාගතහැකි වීම.
(4) පරිපාලන හා නීතිමය කටයුතු කාර්යක්ෂමව කිරීමට හැකිවීම.

38. මිනිසාගේ රෝග නිශ්චය කිරීමේ කටයුතු සඳහා X-Ray භාවිතා නොකර ශක්තිමත් චුම්භක ක්ෂේත්‍රයක් හරහා ශරීරයේ නොයෙකුත් කොටස් වල පින්තූර ලබා ගැනීමට භාවිතා කරන පරිගණක පද්ධතිය හඳුන්වන්නේ කුමන නමකින්ද ?

(1). CT Scan යන්ත්‍රය ලෙසය. (2). MRI Scan යන්ත්‍රය ලෙසය.
(3). EEG යන්ත්‍රය ලෙසය. (4). X-RAY යන්ත්‍රය ලෙසය.

39. විද්‍යුත් තැපැල් ලිපිනයක මුලට යොදන නම කොටස් දෙකකට වෙන්කර ගත යුතු නම් ඒ සඳහා භාවිතා කළ හැකි ඇඳීමේ සලකුණ කුමකුද?

(1). backward slash (\) ය. (2). Under Score (_) ය.
(3). Semicolon (;) ය. (4). Colon (:) ය.

40. පරිගණක අධාරක තොරතුරු පද්ධතියක් එකවරම ප්‍රායෝගිකව භාවිතයට ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

a. පද්ධතිය තුළ ඇති ඒකකයන්ට පරිගණක ආධරක පද්ධතිය අනු ගත කිරීමට හැකිද යන්න
b. නව පද්ධතියේ දෝෂ (bugs) පවතී ද යන්න
c. සත්‍ය තොරතුරු පද්ධතියට ඇතුල් කළ පසු නිවැරදි ප්‍රතිදානය ලැබේද යන්න.
d. හස්තීය (manual) පද්ධතියේ පැවති දූර්වලතාවන් මගහැරිය හැකිද යන්න

(1) b, c ,d ය (2) a, b, c ය (3) a, c, d ය (4) සියල්ලමය